## ජපන් තානාපති කාර්යාලය

නො 20, ග්‍රෙගරි පාර, කොළඹ 7
දුරකථන : +94-11-2693831~3, ෆැක්ස් : +94-11-2699074
ඊමේල් : cultujpn@co.mofa.go.jp


# පුවත්පත් නිවේදනය

පෙබරවාරි 15, 2013

## කෑගල්ල දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ජපන් රජයෙන් රුපියල් මිලියන 8.7 ක ආධාරයක්

කෑගල්ල දිස්ත්‍රික්කයේ දුෂ්කර ගම්මාන කිහිපයක යටිතල පසහුකම් සහ ජිවනෝපායන් නගා සිටුවීම සඳහා බිම් මට්ටමේ මානව සුරැකීමේ වැඩසටහන (GGP) යටතේ ජපන් රජයෙන් ඇමරිකානු ඩොලර් 72,498 (රුපියල් මිලියන 8.7 කට වඩා වැඩි මුදලක් ) පරිත්‍යාග කරන ලදි.

එමම ව්‍යාපෘතිය හරහා ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානය (CDC) මගින් අරණායක ප්‍රාදේශිය ලේකම් බල ප්‍රදේශය තුල සමාගම ඇපලාව සහ අට්ටාපිටිය නම් වු අති දුෂ්කර ගම්මාන තුනක පාරවල් කොන්ක්‍රිට් දමා ප්‍රතිසංස්කරණය කිරීමත් ඇපලාව සහ මොරගම්මන ගම්මානයන්හි ප්‍රජා ශාලා දෙකක් ඉදි කිරීමත් දේශිය අල නිෂ්පාදනය පිළිබඳව පුහුණු වැඩමුලු හරහා ජිවනෝපායන් නගා සිටුවීමත් සිදු කරනු ලැබේ

ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානයේ (CDC) විධායක අධ්‍යක්ෂිකා දමයන්ති ගොඩමුල්ල මහත්මිය පැවසුයේ මෙම ව්‍යාපෘතිය තුලින් අඩු ආදායම්ලාභි පවුල් 2000 කට පමණ ප්‍රතිලාභ ලැබෙන බවත් දේශිය අල නිෂ්පාදනය පිළිබඳව ලබාදෙන පුහුණුව සහ දේශිය අල ගොවිපල හරහා අළුත් රැකියා අවස්ථාවන් ගොඩ නැගෙන බවත් ඒ තුලින් ප්‍රජාවගේ ජිවනෝපායන් වැඩි දියුණු වන බවත්ය එමෙන්ම මෙම ආධාර සැපයු ජපන් රජයටත් ජපන් ජනතාවටත් අරණායක ප්‍රාදේශිය ලේකම් කෙට්ඨාශයේ ප්‍රජාව වෙනුවෙන් කෘතඥ පුර්වක වන බවද ඇය තවදුරටත් පැවසිය.

ජපන් රජය විසින් ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම් ජීවනෝපායන් නගා සිටුවීම සහ කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා ලබාදෙන සහයෝගය වැඩි කර ඇත්තේ ඒ තුලින් රටේ තිරසාර සාමය සහ සංවර්ධනයත් උදාවී ජනතාවේ ජීවන තත්වයන් වැඩි දියුණු වන ඇතැයි යන බලාපොරොත්තුවෙනි.

ආධාර ගිවිසුම ජපන් තානාපති නොබුහිතෝ හොබෝ සහ ප්‍රජා සංවර්ධන මධ්‍යස්ථානයේ (CDC) විධායක අධ්‍යක්ෂිකා දමයන්ති ගොඩමුල්ල මහත්මිය විසින් 2013 පෙබරවාරි 15 දින තානාපති නිල නිවසේදී අත්සන් කරන ලදි.


**වැඩි විස්තර සඳහා**

**ආර්ථික සහයෝගිතා අංශය ජපන් තානාපති කාර්යාලය**

දුරකථන 011-2693831 ext 225

ඊමේල් : cultujpn@co.mofa.go.jp